# පරීක්ෂක වාර්තාව

AA2 විභාගය - ජූලි 2018

## (AA22) පිරිවැය ගිණුම්කරණය හා වාර්තාකරණය

(Cost Accounting and Reporting)

---

ප්‍රශ්න 10 ක් සහිත කොටස් 4 කින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත විය. එමගින් පිරිවැය ගිණුම්කරණයට අදාල මූලික සංකල්ප පිලිබඳ දැනුම පරීක්ෂා කර තිබේ. අයදුම්කරුවන් සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයිය යුතු විය. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රය සමග අමුණා තිබුණි. ප්‍රශ්න 10 සකසා තිබුණේ පහත සඳහන් පරිදිය:

**A – කොටස -** ලකුණු 20

එකිනෙකට වෙනස් ස්වරූපයෙන් යුතු වාස්තවික පරීක්ෂණ ප්‍රශ්නවලින් මෙම කොටස සමන්විත විය. සියලුම ප්‍රශ්න වලට උත්තර ලිවිය යුතු විය.

**B – කොටස -** ලකුණු 25

එකකට ලකුණු 5 ක් බැගින් වූ අනිවාර්යය ප්‍රශ්න පහකි.

**C – කොටස -** ලකුණු 30

එකකට ලකුණු 10 බැගින් වූ අනිවාර්යය ප්‍රශ්න තුනකි.

**D – කොටස -** ලකුණු 25

කොටස් දෙකකින් යුතු එක් අනිවාර්ය ප්‍රශ්නයකි. (A) කොටසට ලකුණු 14 කුත්, (B) කොටසට ලකුණු 11 ක් සහිත එක් අනිවාර්යය ප්‍රශ්නයක් වශයෙනි.

## A - කොටස

(වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න)

(ලකුණු 20)

**ප්‍රශ්න අංක 01** - (ලකුණු 20)

පිරිවැය ගණකාධිකරණ මූලධර්ම පිලිබඳ මූලික කරුණු සහ මූලික ගණනය කිරීම් කෙරෙහි ප්‍රශ්නය ප්‍රධාන වශයෙන් කේන්ද්‍රගත වී තිබුණි. සමස්ත විෂය නිර්දේශයම පරීක්ෂා කර තිබුණි. න්‍යායාත්මක සංකල්ප ඇතුළුව න්‍යායාත්මක ක්ෂේත්‍ර පිලිබඳ ස්ථාවර අවබෝධයක් සහ දැනුමක් අයදුම්කරුවන් තුළ තිබීම අපේක්ෂා කරන ලදී. උත්තර ලිවීමේ කාර්යසාධනය සාමාන්‍ය බව පෙනී ගිය අතර, හොඳින් අධ්‍යයනය සිදුකර තිබූ අයදුම්කරුවන් මෙම කොටසට සම්පූර්ණ ලකුණු ලබා තිබූ බව පෙනුණි. අයදුම්කරුවන් බොහොමයක් මෙම ප්‍රශ්නයට ලකුණු 12 ට වඩා ලබා තිබුණේය. බොහෝ අයදුම්කරුවන්ට මෙම ප්‍රශ්නයෙහි අංක 1.2 ට උත්තර ලිවිය නොහැකි වූ අතර, එමගින් පාලනය කළ නොහැකි පොදුකාර්ය ගැන විමසා තිබුණි. 1.8 ප්‍රශ්නයටද උත්තර ලිවිය නොහැකි වී තිබුණි. තවද, ආන්තික පිරිවැය ගැන විමසා තිබූ ප්‍රශ්න අංක 1.4 ට සියලුම අයදුම්කරුවන් වාගේ නිවැරදිව උත්තර ලියා තිබුණේය. අයදුම්කරුවන් බොහොමයකට ප්‍රශ්න අංක 1.2, 1.5, 1.6 සහ 1.8 ට උත්තර ලිවිය නොහැකි විය.

න්‍යායාත්මක කොටස් මෙන්ම ගණනය කිරීම් කළයුතු කොටස් කෙරෙහිද අයදුම්කරුවන් වැඩි අවධානයක් යොමුකළ යුතුය. පෙර විභාගවල පරීක්ෂකවරයන්ද මෙම කරුණ පෙන්වා දී තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක විය.**

## B කොටස

(එකකට ලකුණු 5 බැගින් අනිවාර්ය ප්‍රශ්න 5 කි)

(මුළු ලකුණු 25)

### ප්‍රශ්න අංක 02

පිරිවැය ගිණුම්කරණය සහ මූල්‍ය ගිණුම්කරණය පිළිබඳ න්‍යායාත්මක දැනුම පිළිබඳ මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර ඇත. බොහොමයක් අයදුම්කරුවන් පිරිවැය ගිණුම්කරණයේ අරමුණු තේරුම්ගෙන නොතිබූ අතර, ඔවුනොවුන්ගේ පුද්ගලික විනිශ්චයන් මත පදනම්ව උත්තර ලියා තිබුණි. මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ සමස්ත කාර්යසාධනය ඉතා දුර්වල මට්ටමක පැවතිණි. අයදුම්කරුවන් අතලොස්සකට පමණක් මෙම ප්‍රශ්නය සඳහා සම්පූර්ණ ලකුණු උපයා ගැනීමට හැකිවිය.

මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැය ගිණුම්කරණය පිළිබඳ වෙනස්කම් සඳහන් කිරීමද අවශ්‍යකර තිබුණි. එක් එක් ක්‍රමයේ ලක්ෂණ සඳහන් කර තිබුණ නමුත් ඒවා අතර වෙනස්කම් අයදුම්කරුවන් විසින් වෙන්කර දක්වා තිබුණේ නැත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය ඉතාමත් දුර්වල විය.**

### ප්‍රශ්න අංක 03

ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුතු (FIFO) ක්‍රමය භාවිත කර 2018 ජුනි මාසය සඳහා ගබඩා ලෙජරය පිළියෙල කිරීම අවශ්‍ය කර තිබුණි. මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන් ඉතා හොඳින් උත්තර සපයා තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් ප්‍රශ්නයට සම්පූර්ණ ලකුණු ලබා තිබුණේය. අයදුම්කරුවන්ගෙන් ඉතා සුළු පිරිසක් ගබඩා ලෙජරය සඳහා නිවැරදි ආකෘතිය භාවිත කර තිබුණේ නැත. කෙසේවෙතත්, ඔවුන් අවසාන තොග ශේෂයේ අගය සෙවීම නිසා ලකුණු ලබාගැනීමට සමත්විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය ඉතා සතුටුදායක විය.**

### ප්‍රශ්න අංක 04

**සීමාසහිත රම්බෝ පොදු සමාගමේ** X සහ Y යන සේවකයන් දෙදෙනාගේ පසුගිය සතියේ මුළු ඉපැයීම් වෙන වෙනම ගණනය කිරීම අපේක්ෂා කර ඇත. ප්‍රශ්න අංක **02** හා **03** උත්තර සමග සසඳා බලන විට මෙම ප්‍රශ්නයට ලබා දී තිබූ උත්තර එතරම් සතුටුදායක නොවිය. ප්‍රසාද දීමනා ගණනය කිරීම සඳහා ඉතිරිකළ කාලය, පැය ගණන හඳුනා ගැනීම, මුළු ඉපැයීම් ගණනය කිරීමට පෙර කළ යුතුව තිබුණි. අයදුම්කරුවන් බොහෝ දෙනෙකු ප්‍රසාද දීමනා ප්‍රමාණය ගණනය නොකොට, සේවකයන් දෙදෙනාගේ සාමාන්‍ය ඉපැයීම් පමණක් ගණනය කර තිබුණි. ඒ අනුව, ඔවුන්ට මුළු ලකුණු ලබාගත හැකිවිය. ගණිතමය දෝෂ නිසා උත්තර වැරදීගිය අයදුම්කරුවන් අතලොස්සක්ද විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

### ප්‍රශ්න අංක 05

සමාගමේ නිෂ්පාදිතයක් වූ කාණ්ඩ **අංක 1010** ට අදාලව ඒකකයක පිරිවැය ගණනය කිරීම අවශ්‍ය විය. මෙය ඉතා සරල ප්‍රශ්නයකි. දෙනලද අන්තර්ග්‍රහණ අනුපාත භාවිත කර, අදාල දෙපාර්තමේන්තු සඳහා නිවැරදි පොදුකාර්ය ප්‍රමාණයන් ගණනය කිරීම අවශ්‍ය විය. අයදුම්කරුවන් සියලු දෙනාම වාගේ මෙම ප්‍රශ්නයට උත්තර සපයා තිබූ අතර, සම්පූර්ණ ලකුණු හෝ සතුටුදායක ලකුණු ලබා තිබුණේය. ඒකකයක පිරිවැය ගණනය කර නොපෙන්වීම නිසා කීප දෙනෙකු සම්පූර්ණ ලකුණු ලබාගැනීමට අසමත් විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය ඉතාමත් සතුටුදායක විය.**

### ප්‍රශ්න අංක 06

සමච්ඡේද ලක්ෂ්‍යය ඒකක වලින්ද, වටිනාකමින්ද, සුරක්ෂිත ආන්තිකය ඒකක වලින්ද ගණනය කිරීම අවශ්‍ය විය. මෙයද ඉතාම සරල ප්‍රශ්නයකි. කෙසේවුවද, අයදුම්කරුවන් සැහෙන ප්‍රමාණයක් නිවැරදි සූත්‍ර හඳුනා නොගැනීම නිසා ලකුණු අහිමි කරගෙන තිබුණි. අනෙකුත් අය ප්‍රශ්නයේ අවශ්‍යතා සපුරා සම්පූර්ණ ලකුණු ලබාගැනීමට සමත් විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය ඉතාමත් සතුටුදායක විය.**

## C කොටස

(එකකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 3 කි)

(මුළු ලකුණු 30)

### ප්‍රශ්න අංක 07

අමුද්‍රව්‍ය තොග පාලන ගිණුම, නොනිමි වැඩ පාලන ගිණුම, නිමිභාණ්ඩ පාලන ගිණුම සහ නිෂ්පාදන පොදුකාර්ය පාලන ගිණුම පිළියෙල කිරීම අවශ්‍යකර තිබුණි. අයදුම්කරුවන් බොහොමයක් මෙම ප්‍රශ්නයට ඉතාමත් දුර්වල ආකාරයට උත්තර ලියා තිබුණේය. උත්තර අනුව පෙනී ගියේ ඔවුන් බොහෝ දෙනෙකු සංකලිත ගිණුම් ක්‍රමයට අදාල මූලධර්ම වටහාගෙන නොතිබූ බවය. අයදුම්කරුවන් සැහෙන ගණනක් හර හා බැර පැති වරදවා තේරුම්ගෙන තිබූ බවද පෙනුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

### ප්‍රශ්න අංක 08

මෙහිදී, පෙරසැරි I ගිණුම පිළියෙල කිරීම අවශ්‍ය විය. ආරම්භක හෝ අවසාන නොනිමි වැඩ කිසිවක් නොතිබූ බැවින් බොහෝ අයදුම්කරුවන් විසින් ඉහළ ලකුණු ලබාගැනීමේ හැකියාවක් පැවතුණි. කෙසේවුවත්, මෙම ප්‍රශ්නය සඳහා කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුණි. උත්තරවලින් පෙනී ගියේ සමහර අයදුම්කරුවන් "T" ගිණුම් වෙනුවට වැරදි ආකෘති භාවිතකර තිබූ බවය. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුට සාමාන්‍ය අපතය ගණනය කිරීමේදී වැරදී තිබුණේය. තවද පෙරසැරි II ට මාරුකළ නිමැවුමේ අගය නිවැරදිව ගණනය කිරීමට ඔවුන්ට නොහැකි විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

### ප්‍රශ්න අංක 09

එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුවට පොදුකාර්ය පිරිවැය විභජනය කර බෙදාහරින ආකාරය පෙන්වන ප්‍රකාශනයක් පිළියෙල කිරීමද අයවැයගත යන්ත්‍ර පැය ගණන පදනම් කර ගනිමින් එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුව සඳහා පොදුකාර්ය අන්තර්ග්‍රහණ අනුපාතය ගණනය කිරීමද අවශ්‍ය විය. අයදුම්කරුවන් සියලුදෙනාම වාගේ මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබූ අතර, සතුටුදායක අන්දමින් ලකුණුද ලබා තිබූ බව පෙනී ගියේය. කෙසේවුවද, දී තිබූ පොදුකාර්ය වෙන්කිරීමේ නිවැරදි පදනම හඳුනාගැනීමට නොහැකි වූ අයදුම්කරුවන් ස්වල්ප දෙනෙකු සිටි බව පෙනුණි. තවද, උත්තර පත්‍ර ඇගයීමේදී ගණිතමය දෝෂ තිබූ බවද දක්නා ලදී. තවත් සමහර අයදුම්කරුවන් හට සේවා දෙපාර්තමේන්තු පොදුකාර්ය නිෂ්පාදන දෙපාර්තමේන්තුවලට නැවත වෙන්කිරීමට අමතක වී තිබූ බව පෙනුණි. තවත් සමහරු විසින් දහස් ගණන් වලින් ලබාගත් වටිනාකම්, පොදුකාර්ය අන්තර්ග්‍රහණ අනුපාත ගණනය කිරීමේදී පටලවාගෙන තිබූ බව දක්නා ලදී.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක විය.**

## D කොටස

(අනිවාර්ය ප්‍රශ්නයකි)

(ලකුණු 25)

### ප්‍රශ්න අංක 10

**(A) කොටස:**

විකුණුම් අයවැය, නිෂ්පාදන අයවැය, ඍජු ද්‍රව්‍ය භාවිත අයවැය, ඍජු ද්‍රව්‍ය ගැනුම් අයවැය හා ඍජු ශ්‍රම පිරිවැය අයවැය පිළියෙල කිරීම අයදුම්කරුවන්ගෙන් අපේක්ෂා කර තිබුණි. කෙසේවුවත්, අයදුම්කරුවන් බොහොමයක් මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබුණේ නැත. උත්තර අනුව පෙනී ගියේ බොහෝ අයදුම්කරුවන් මෙම කොටස් නිසිලෙස අධ්‍යයනය කර නොතිබූ බවය. මෙය, ලොකු වෑයමකින් තොරව, ලකුණු උපයාගත හැකිව තිබූ ඉතාමත් පහසු ප්‍රශ්නයක් විය. එහෙත්, අයදුම්කරුවන් එයට නිසිලෙස උත්තර ලියා තිබුණේ නැත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය ඉතාමත් දුර්වල විය.**

**(B) කොටස:**

ප්‍රශ්නයේ දී තිබූ විචලනයන් ගණනය කිරීම මෙම ප්‍රශ්නයෙන් අවශ්‍යව තිබුණි. මෙයද සරල ප්‍රශ්නයක් විය. එසේවුවද, අයදුම්කරුවන්ගෙන් බොහොමයක් නිවැරදි ලෙස උත්තර සපයා තිබුණේ නැත. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු විචලනයන් ගණනය කිරීමේ සූත්‍ර දැන නොසිටි බව පෙනුණි. සමහරු සියලුම විචලනයන් පටලවාගෙන තිබුණි. සැලකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් ගණනය කළ විචලනයන් "වාසි" ද "අවාසි" ද යන්න සඳහන් කර තිබුණේ නැත. සමහරු ලබාගත් ආකාරය සඳහන් නොකොට උත්තරය ඔහේ ලියා තිබූ අතර, එයද වැරදි විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

\- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

1. නව විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා නව විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.

2. ප්‍රශ්නය කිහිප වතාවක් මනා අවධානයකින් කියවිය යුතු අතර, අවශ්‍ය තැන්වලදී පෙරවැඩ පැහැදිලිව පෙන්විය යුතුය.

3. ප්‍රශ්න වලට උත්තර සැපයීමේදී උපකල්පනයන් කර ඇත්නම් ඒවා පැහැදිලිව පෙන්විය යුතුය.

4. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.

5. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

6. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා යෝජිත උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය. සමාන රටාවන්ගෙන් හා ව්‍යුහයන්ගෙන් යුත් ප්‍රශ්න නැවත නැවත විභාගයන්හිදී පරීක්ෂා කළ හැකි බැවින් මෙම ක්‍රමය අනුගමනය කිරීම වාසිදායකය.

7. ස්ව-අධ්‍යයන පාඩම්මාලා අධ්‍යයනය කිරීම හා එහි ඇති උත්තර පරිශීලනය කිරීම ඉතා වැදගත්ය.

8. මෙම විෂය සම්බන්ධව ඇති පොත්පත්, සඟරා හා ලිපි ආදිය පරිශීලනය කළ යුතුය.

9. විභාගයේදී කාලය මනාව කළමනාකරණය කර ගැනීම. එක් එක් ප්‍රශ්නයට වෙන්කර ඇති ලකුණු මගින් ඒ සඳහා වෙන්කළ යුතු කාලය පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකිය.

10. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

\- * * * -